රැකවරණ සැලසුම් ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ මාර්ගෝපදේශ (CAM 1,CAM2, CAM3, CAM4)

**<u>ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය DPCCS – CAM 1</u>**

1. ලියාපදිංචි කිරීමේ කේතය - DPCCS/CP/දිස්ත්‍රික්කය/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/ කීවෙනි රැකවරණ සැලසුමද යන්න සටහන් කරන්න .
   උදා :-DPCCS/CP/ PO/ELA/2 (පොලොන්නරුව/ඇලහැර පාදේශීය ලේකම් කොටඨාසය/2 වන සැලසුම
2. සිද්ධි කළමණාකරුගේ කේතය - CRPO/CRPA / තම පුද්ගලික ලිපි ගොනු අංකය (personal file number) සටහන් කරන්න
   උදා:- පුද්ගලික ලිපි ගොනු අංකය 198 නම් CRPO/CRPA /198 (CRPO/CRPA තමාට අදාල නොවන තනතුර තනි ඉරකින් කපා හරින්න.
3. ලියාපදිංචි කිරීමේ දිනය :- තමාට සිද්ධිය ලැබුනු දිනය සටහන් කරන්න

   දිස්ත්‍රික්කය :- තමා සේවය කරන දිස්ත්‍රික්කය සටහන් කරන්න

   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- තමා සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සටහන් කරන්න.

4. රැකවරණ සැලසුම අවශ්‍ය දරුවා පිළිබඳ තොරතුරු:- මෙහිදී පවුලේ දරුවන් කිහිප දෙනෙකු සිටී නම් වඩාත් අවදානම් සහගත බවට ඔබ විසින් හඳුනා ගත් දරුවාගේ නම සඳහන් කරන්න. (සැ.යු. සෙසු දරුවන්ගේද අවදානම් සහගත බව ඉතා ඉහල නම් ඔවුන් වෙනුවෙන් වෙන්වෙන් වශයෙන් වූ රැකවරණ සැලසුම් සකස් කරන්න.)

   දරුවාගේ සම්පූර්ණ නම, උපන්දිනය, වයස,ස්ත්‍රී පුරුෂ බව, ග්‍රාම නිලධාරී වසම, මව/පියා භාරකරුගේ නම (මෙහිදී සටහන් කරන නම සඳහන් පුද්ගලයා දරුවාට ඇති ඥාතීත්වය වරහන් තුළ සටහහන් කරන්න) ,

5. දරුවාගේ අධ්‍යාපන තොරතුරු ඇතුලත් කරන්න.

6. පවුලට ලැබෙන ආධාර :- ලැබෙන ආධාර වර්ගය/වර්ග √ සලකුණු කරන්න . කිසිදු ආධාරයක් නොලබයි නම් එය × ලකුණු කරන්න වෙනත් ආධාරයක් ලබයි නම් එම ආධාර වර්ගය කුමක්ද යන්න ලියා දක්වන්න.

7. පවුලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු :-දරුවා සමග ජීවත් වන පවුලේ සියළු සාමාජිකයන්ගේ තොරතුරු මෙහි ඇතුලත් කරන්න. දරුවාගේ මව , පියා දරුවා සමග මෙම නිවසේ ජීවත් නොවුනද ඔවුන් පිළිබඳ තොරතුරු සටහන් කරන්න.දරුවා සම්බන්ධ තීරණ ගැනීමේදී ඔවුන් කොහේ සිටිය ද /ජීවත් නොවුව ද තොරතුරු වැදගත් වේ.

   රැකියාව /තත්වය - මෙම කොටස තුළ වැඩිහිටියෙකු නම් ( අවු:18 ට වැඩි) රැකියාව ද ළමයෙකු නම් (අවු:18 ට අඩු)පෙර පාසල් යයි, පාසල් යයි/ පාසල් නොයයි වශයෙන් තොරතුරු ඇතුලත් කරන්න.

   විශේෂ කරුණු - මෙම කොටස තුළ පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් සටහන් කල යුතු සුළු හෝ විශේෂ කරුණක් ඔබ හඳුනා ගත්තේ නම් සටහන් කරන්න.උදා:-

| # | නම | දරුවාට ඇති ඥාතීත්වය | වයස | විවාහක/ අවිවාහක | රැකියාව/තත්වය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|
| 1 | දමිත් සේනාධීර | පියා | 48 | විවාහන | කුලී වැඩ | එක ඇසක් නොපෙනේ |
| 2 | අමිතා කුරේ | මව | 42 | විවාහක | - | පවුල හැරගොස් වෙනත් විවාහයක් සිදුකරගෙන සිරි නිවාස මාවත ,කළුතර -උතුර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ලිපිනයේ පදිංචි බව නිවැසියන් පවසයි. |
| 3 | කුලසිරි අප්පුහාමි | සීයා | 70 | විවාහක | - | අංශභාග රෝගී |
| 4 | රෝහිණී මැණිකේ | නැන්දා | 32 | අවිවාහක | - | රෝගී පියා රැක බලා ගනී. |
| 5 | අරුණ ඉන්ද්‍රජිත් | සහෝදරයා | 08 | අවිවාහක | පාසල් යයි | - |
| 6 | ප්‍රියංවදා කුමාරි | සහෝදරී | 06 | අවිවාහක | පාසල් නොයයි | උපත ලියාපදිංචි කර නැත. |

8. නිලධාරියා දකින ආකාරයට දරුවා මුහුණ දෙන ප්‍රධාන ගැටළුව/ගැටළු සටහන් කරන්න.(මෙහිදී අංක 4 යටතේ රැකවරණ සැලසුම සකස් කිරීමට හදුනා ගත් දරුවා පිළිබඳ තොරතුර සටහන් කරන්න. උදා:- දරුවන් තිදෙනෙකුගෙන් යුක්ත පවුලකි. මව දරුවන් හැරගොස් වසර 02 කි.පියා දරුවන් ගැන සොයා නොබලයි.ජීවත් වන නිවස ගරා වැටුණු අබලන් තත්වයේ පවතී.

9. දරුවාගේ චිත්තවේග තක්සේරුවක් සිදු කරන්න ( මෙය දරුවාගෙන් ඍජු ප්‍රශ්න කිරීමකින් නොව දරුවා සමග සාකච්ඡා කෙරෙන කරුණු තුළදී දරුවාගෙන් ප්‍රකාශ වන හැගීම් තුළින් හඳුනා ගන්න)

10. දරුවාගේ චර්යා තක්සේරුවක් සිදු කරන්න. ( මෙය දරුවාගෙන් ඍජු ප්‍රශ්න කිරීමකින් නොව දරුවා සමග සාකච්ඡා කෙරෙන කරුණු තුළදී දරුවාගෙන් ප්‍රකාශ වන හැගීම් තුළින් හඳුනා ගන්න)

11. ගැටළුව යොමු වූ ආකාරය :- කරුණට අදාල අංකය සටහන් කරන්න
උදා:- ග්‍රාමීය ළමා සංවර්ධන කමිටුව මගින් යොමු වූ ගැටළුවක් නම් කොටුව තුළ 6 යොදන්න.

12. නිවසට යන පාර හඳුනාගත හැකි වන සේ ඇඳ දක්වන්න.

<u>ආරම්භක තක්සේරු නියදි ආකෘති පත්‍රය DPCCS – CAM 2</u>

ලියා පදිංචි කිරීමේ කේතය හා සිද්ධි කළමණාකරුගේ කේතය DPCCS – CAM 1 පරිදිම යොදන්න.

මෙම ආකෘති පත්‍රයේදී සිදුවනුයේ බරපතල අවදානමකට ලක්විය හැකි බවට ඔබ විසින් හදුනා ගත් දරුවා තක්සේරු කිරීමයි. රැකවරණ සැලසුම සකස් කිරීමට ඉතා වැදගත් වන පියවර මෙයයි. තක්සේරු කිරීම යනු දරුවෙකුගේ තත්වය පිළිබඳව වෘත්තීමය විනිශ්චයක් ගැනීම සඳහා සිදුකරන තොරතුරු රැස් කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියයි.ඔබ විසින් සිදුකරනු ලබන නිවැරදි තක්සේරුව අනුව දරුවා වෙනුවෙන් සැකසෙන රැකවරණ සැලසුමට පදනම සැකසේ.

1. දරුවාව තක්සේරු කිරීම

1. දරුවාව තක්සේරු කිරීම - බරපතල අවදානමකට ලක්විය හැකි බව පෙන්නුම් කරන නිර්නායක කිහිපයක් මෙහි සටහන් කර ඇත . එක් එක් සාධකයට අදාලව දරුවා පිළිබඳව හොඳින් අධ්‍යයනය කර අදාල අවදානම් සාධක පවතී නම් √ සලකුණද නොපවතී නම් × සලකුණ ද අදාල කොටුවල සටහන් කරන්න. එම අවදානම් අතුරින් වඩා බරපතල කාරණා ප්‍රමුඛතා ගත කර 1,2,3, වශයෙන් ප්‍රමුඛතාවය අනුව අංක කරන්න යන කොටසේ අදාල කොටු තුළ දක්වන්න.